**කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2014**

**-----------------------------------------------------------------**

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව අතර 2012 මැයි 18 දින එළඹි අංක 8145 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ II වගන්තිය (බී.3) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ කොළඹ මහනගර සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ ජල ද්‍රෝණිය පෝෂක ප්‍රදේශයේ ජලගැල්ම අඩු කිරීමට, තෝරාගත් ආදර්ශන ආයෝජනයන් මඟින් ප්‍රාදේශීය යටිතල හා සේවා පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 42,031.74 කට සමාන එ.ජ.ඩො මිලියන 321 ක් වන අතර ඉන් එ.ජ.ඩො මිලියන 213 ක් හෙවත් සියයට 66.35 ක් මූල්‍යායනය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 10 දින ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 වන විට නිමකිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය

පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව,

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්‍ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | 2014 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ප්‍ර සං ජා බැ | 213 | 27,890.22 | 8,244.00 | 26.97 | 3,531.70 | 46.15 | 6,042.66 |
| ශ්‍රී ලං ර | 108 | 14,141.52 | 756.00 | 5.77 | 755.96 | 9.43 | 1,234.18 |
| එකතුව | 321 | 42,031.74 | 9,000.00 | 32.74 | 4,287.66 | 55.58 | 7,276.84 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ඉලක්ක ඉටුකරගැනීම සඳහා වගකීම් දක්වමින් සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක මතුකර දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු වුවත් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම කරුණ හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතිය විසින් ඉටුකර ගන්නා ලද තථ්‍ය කාර්යසාධනය තහවුරු කරගත නොහැකි විය.

(ආ) තවද, මාස 30 ක් හෙවත් ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් සියයට 50 ක් ඉකුත් වීමෙන් පසුව, ලද මුළු අරමුදල්වලින් සියයට 17.31 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබූ අතර එදිනට සමස්ත භෞතික ප්‍රගතිය තහවුරු කරගත නොහැකි විය. ඒ අනුව, ව්‍යාපෘතියේ ඉතිරි මාස 30 ක කාල පරිච්ඡේදය තුළ සියයට 82.69 ක ඉතිරි අරමුදල් උපයෝජනය කිරීමේ හැකියාව විගණනයේදී සැක සහිතය.
මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය ආරම්භයේ සිට සියලු උප සංරචකයන් පිළිබඳ කාර්යයන් ස්වාධීනව ආරම්භ කළ හැකිව තිබුණද, පහත සඳහන් සංරචකයන් සඳහා මුළු අරමුදල් වෙන්කිරීම් සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණි.

| උප සංරචක සඳහා යොමුව | උප සංරචක | ඇස්තමේන්තුගත පිරිවැය |
|---|---|---|
| | | රු.මිලියන |
| 1.3 | ජලගැලීම් හා ජලාපවාහන කළමනාකරණය සඳහා ධාරිතා වැඩිදියුණු කිරීම. | 2,016.48 |
| 2.1 | කොලොන්නාව නගර සභාව සඳහා වැඩිදියුණු කිරීම් සහාය | 316.87 |
| 2.2 (අ) | පොදු නියෝජිතායතන සඳහා අගනගර සංවර්ධන උපායමාර්ග, සැලසුම්, ශක්‍යතා අධ්‍යයනයන් | 518.52 |
| 2.2 (ආ) | පළාත් පාලන ආයතන සඳහා ආයතනික ශක්තිමත් කිරීම සහ ධාරිතා වර්ධනය | 216.05 |

(ii) තවද, විශාල ජලගැලීම් අවම කිරීම සඳහා සම්පූර්ණයෙන් අරමුණු කරගත් ජලගැලීම් අපවහන කළමනාකරණය යටතේ ප්‍රාථමික හා ද්වීතීය ඇලමාර්ග හා ජලාශ පිළිබඳ උප සංරචකය සඳහා වෙන් කරන ලද අරමුදල්වලින් රු.මිලියන 13,529 ක්වූ සියයට 6.4 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

3.3 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් 03 ක් යටතේ සිදුකරන ලද කාර්යයන්වල භෞතික ප්‍රගතිය පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල ගැලීම් හා ජලාපවහන කළමනාකරණ සංරචකය යටතේ ශාන්ත සෙබස්තියන් දකුණු ඇල ඉවුරු ආරක්ෂා කිරීම හා ඩී. ආර්.විජේවර්ධන මාවතේ " මැකාකුම් " පිවිසුම්

උද්‍යානය සංවර්ධනය කිරීම වෙනුවෙන් සිදුකරන කාර්යයන් සඳහා 2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 24 ක හා සියයට 50 ක ඉලක්කයක් සපුරා ගැනීමට අපේක්ෂා කර තිබුණද සිදුකරන ලද කාර්යයන්වල භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 18.5 ක් හා සියයට 30 ක් ලෙස වාර්තා කර තිබුණි.

(ආ) කොළඹ අගනගරයේ පළාත්පාලන ආයතන සඳහා නාගරික සංවර්ධන යටිතල පුනරුත්ථාපනය හා ධාරිතා වර්ධනය සංරචකය යටතේ මට්ටක්කුලිය කාක දූපතේ වෙරළ උද්‍යානයක් ඉදිකිරීම හා පොදු පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් සිදුකරන කාර්යයන් සඳහා 2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 55 ක හා සියයට 9 ක ඉලක්කයක් සපුරා ගැනීමට අපේක්ෂා කර තිබුණද, සියයට 27 ක හා සියයට 3 ක භෞතික ප්‍රගතියක් වාර්තා කර තිබුණි. ඊට අමතරව ග්‍රෙගරි ඇල පුනරුත්ථාපනය කිරීමේ කාර්යයන් සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා ප්‍රදේශයේ යටිතල සංවර්ධනය පිළිබඳ පැකේජ 11 යටතේ සිදුකරන ලද කාර්යයන් 2014 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 5 ක හා සියයට 3 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

(අ) නගර ශාලා චතුරශ්‍රයේ (Town Hall Square) ආදර්ශ කලාප සංවර්ධනය පිළිබඳ පැකේජ III යටතේ සිදුකරන ලද කාර්යයන් පිළිබඳ විගණකවරුන් විසින් කරන ලද ස්ථානීය පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විහාරමහා දේවී උද්‍යානයේ අංක බී 1 කලාපය සඳහා ප්‍රවේශ මාර්ගයේ පදික ප්‍රදේශය කොන්ක්‍රීට් කිරීම සඳහා පිළියෙල කරන ප්‍රමාණපත්‍ර විෂයයන් තුනක් සාධාරණ ආකාරයෙන් ප්‍රමාණපත්‍ර පිළියෙල කිරීමේ දුර්වලතා හේතුවෙන් සියයට 129 කින්, සියයට 45 කින්, සියයට 14 කින් ඉක්මවා තිබුණි. තවද, අදාළ පාර්ශවයන්ගෙන් අනුමැතීන් නොමැතිව එම විචලනයන් සඳහා ගෙවීම් කර තිබුණි. පදික ප්‍රදේශයේ එක් ස්ථානයක මීටර් 10 ක් දිගට පිපිරීමක් ඇතුළත්ව ස්ථාන 15 ක පිපිරීම් විගණන පරීක්ෂණයන්හිදී නිරීක්ෂණය විය.

(ii) රු. 2,504,625 ක පිරිවැයකට විහාරමහා දේවි උද්‍යානයේ කලාප බී 1 හි පොකුණු ඉදිකිරීම්වල විදුලි හා ජල නළ සැපයුම් සවිකිරීම් සඳහා ආරම්භකව ඉදිරිපත් කරනලද කොන්ත්‍රාත්තුව සාර්ථකව නිමකර නොතිබූ අතර සවිකරන ලද විෂයයන් දෝෂ සහිත බව නිරීක්ෂණය විය. කෙසේවුවද දෝෂ පිළියම් කිරීම සඳහා ඉල්ලීමකින් හෝ පළමු කොන්ත්‍රාත්කරුගෙන් පිරිවැය අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව විචලන නියෝගයන් යටතේ රු.2,002,378 ක පිරිවැයකට වෙනත් කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. කෙසේවුවද විදුලි හා ජල නළ සවිකිරීම් වැඩ සාර්ථකව නිමකර නොතිබූණු බව නිරීක්ෂණය විය. විගණකවරුන් විසින් කරන ලද භෞතික පරීක්ෂණයන්හිදී පහත කරුණු නිරීක්ෂණය විය.

- වයරින් වැඩ විධිමත්ව සිදුකර නොතිබූ අතර පිටතට අනාවරණය වී තිබුණි.
- රු.190,300 ක් වටිනා වෝටර් ජෙට් 22 ක් සහ රු.518,700 ක් වටිනා ලයිට් 22 ක් ආදේශ කර තිබුණු අතර ගලවන ලද විෂයයන් ගබඩාවට භාර දී නොතිබුණු බව නිරීක්ෂණය විය.
- ආලෝකකරණ පද්ධතියේ පිරිවිතරයන් විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින් එහි සවිකිරීම් පිළිබඳ තත්ත්වය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය. තවද ආලෝකකරණ පද්ධතියේ වොල්ටීයතාවය, බලය, LED තත්ත්වය, මතුපිට විෂ්කම්භය ආදිය විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

(iii) මීට අමතරව, විහාර මහා දේවි උද්‍යානයේ බී 1 කලාපයේ පොකුණු ඉදිකිරීම සඳහා සිදුකරන ලද වැඩ පිළිබඳ වැඩ බිම් පරීක්ෂාවේදී බොහෝ අඩුපාඩු නිරීක්ෂණය විය. එවැනි අවස්ථා පහත පරිදි සාරාංශ කෙරේ.
- ප්‍රවේශ මාර්ගයේ දකුණු පස ස්ථානගත පොකුණේ පිපිරීම් 4 ක් විය.
- පදික මඟ විධිමත්ව ඉදිකර නොතිබුණි.
- ප්‍රවේශ මාර්ගයේ වම්පස ස්ථානගතව ඇති පොකුණේ ස්ථාන 03 ක ජල කාන්දු හා බිත්තියේ කුහර නිරීක්ෂණය විය.

(iv) රු. 3,475,000 ක පිරිවැයකට විහාරමහා දේවි උද්‍යානයේ බී 4 කලාපයේ විනෝද චාරිකා ප්‍රදේශයේ සිදුකරන ලද ඉදිකිරීම් වැඩ විධිමත් සැලැස්මක් නොමැතිව සිදුකර තිබුණි. තවද තත්ත්ව සහතිකය සැලකීමෙන් තොරව ඉදිකිරීම සඳහා බාල වර්ගයේ භාණ්ඩ යොදා ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

- විෂය අංක X1, X2 හා X5 යටතේ විනෝද කුඩාරම් වහළ සඳහා ජී අයි පයිප්ප 10 ක් යොදා ගැනීම අවශ්‍ය වුවද, මි.මි 50 ජී අයි පයිප්ප 06 ක් පමණක් යොදා ගෙන තිබූ බව නිරීක්ෂණය විය. තවද, මි.මි 100x50x6 යකඩ බාර් යොදා ගැනීම අවශ්‍ය වුවද මි.මි 100x50x3 යකඩ බාර් යොදාගෙන තිබුණි. මේස හා බංකු සඳහා යොදාගෙන තිබූ දැව පිරිවිතරයන්හි සඳහන් ප්‍රමිතීන්ට අනුව නොවූ අතර ඒ අනුව එහි ශක්තිමත්බව හා කල්පැවැත්ම තහවුරු නොවීය. තවද ලී බාර් වල තීන්ත ආලේප කර නොතිබුණි.

- විෂය අංක X 3 හා X4 යටතේ ඉදිකරන ලද කුඩාරම් 06 ක වහළ සඳහා ජීඅයි පයිප්ප 48 ක් අවශ්‍ය වුවද මි.මි 50 ජීඅයි පයිප්ප 96 ක් ඒ සඳහා යොදා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

- විෂය අංක X3B1 යටතේ, බංකු සඳහා මි.මි 550 x මි.මි 550 ප්‍රමාණය අවශ්‍ය විය. කෙසේවුවද බංකුවල ප්‍රමාණය මි.මි 550 x මි.මි 450 විය. එබැවින් බංකුවල ප්‍රමාණය පිරිවිතර ප්‍රමාණයට වඩා කුඩා වී තිබුණි.

- විෂය අංක X4 B2, යටතේ බංකුවක් සඳහා ආධාරක 04 ක් සවිකළ යුතුය. කෙසේවුවද ආධාරක 03 ක් පමණක් යොදාගෙන තිබුණි.

- X3 හා X4 යටතේ මේස හා බංකු සවිකිරීම සඳහා යොදාගත් ගම් වර්ගය බාල වර්ගයේ වූ අතර, ඒ හේතුවෙන් සවි කිරීමේ ස්ථානයන්හි මළ බැඳීම සඳහා විවෘතව තිබීමෙන් සවිකිරීම්වල කල්පැවැත්මට එය බලපා තිබුණි.

- X1 විෂය යටතේ කුඩා දුම්රිය සැපයීම හා සවිකිරීම සඳහා අතිරේක වැඩ ලෙස රු. 2,000,000 ක වෙන් කිරීමක් කර තිබූ නමුත් 2015 ජුනි 05 වන විටත් එය ආරම්භ කර නොතිබුණි. කුඩා දුම්රියේ කොටස් උද්‍යානයේ ගාල් කර තිබුණි.

(ආ) විහාරමහා දේවී උද්‍යානයේ ප්‍රධාන ප්‍රවේශ මාර්ගයේ වම් පැත්තෙහි ඉදිකරන ලද සක්මන් මග (Walking Path) ප්‍රමිතියට අනුව ඉදිකර නොතිබූ අතර ස්ථාන කිහිපයක ඇස්පල්ට් ස්ථරය හානි වී තිබුණි.

(ඇ) රු. 44,948,514 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පොදු පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ කාර්යයන් සිදුකිරීම සඳහා 2013 ඔක්තෝබර් 25 දින පුද්ගලික සමාගමක් සමඟ ව්‍යාපෘතිය ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වැසිකිළිවල සවිකරන ලද " යූරිනල් සෙන්සර්ස් " 9 ක් අක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය.

(ii) සෝන්ඩර්ස් පෙදෙසේ වැසිකිළි බිත්තිවල පිපිරීම් දිස් වූ අතර සමහර පිපිරීම් වහළය දක්වා පැතිරී තිබුණි. දොරවල් විධිමත් පරිදි සවිකර නොතිබූ බැවින් වැසිකිළි දොරවල් වැසීමට නොහැකි වී තිබුණි. තවද මලාපවහන පද්ධතිය විධිමත් පරිදි සවිකර නොතිබූ අතර, යාබද මාර්ගයට හා ආබාධිත පුද්ගලයන්ට වෙන්කර තිබූ වැසිකිළිය ඉතිරී යමින් තිබුණි.

(iii) පිලිප් ගුණවර්ධන මාවතේ වැසිකිළියට ලී වැඩ සඳහා මීටර් 4.3 කට රු. 23,650 ක මුදලක් ගෙවීම් කර තිබුණද, සිදුකළ තථ්‍ය ලී වැඩ ප්‍රමාණය මීටර් 1.5 ක් විය. එබැවින් රු. 15,400 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රයෝජනයට ඉඩදී තිබුණු රු. 7,084,244 ක පිරිවැයකට පිලිප් ගුණවර්ධන මාවතේ ඉදිකර තිබූ වැසිකිළි නිෂ්කාර්යව පැවතුණි.

(v) මෝදර උමඟ (Mutwal Tunnel) ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. 409,971,109 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණද, එම උමඟ ඉතා පැරණි බවත්, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සුදුසු නොවන බවත් විගණනයේදී නිරීක්ෂණය විය. තවද ගේබියන් බිත්තිය විධිමත්ව ඉදිකර නොතිබුණි.

(ඈ) නගර ශාලා චතුරශ්‍රය සංවර්ධනය කිරීම පිළිබඳව කරන ලද විගණන පරීක්ෂණයට අනුව මාගේ පෙර විගණන වාර්තාවෙන් වාර්තාකරණ ලද, ඉඩම විධිමත්ව මට්ටම් නොකර පිඩලි ඇල්ලීම, සහ පැලැටි වැවී තිබීම ආදී අඩුපාඩු නිවැරදි කර නොතිබූ අතර බිම නඩත්තු කිරීමේ දුර්වලතා හේතුවෙන් නගර ශාලා චතුරශ්‍රයේ තත්ත්වය 2015 අප්‍රේල් 30 දිනට තවදුරටත් පිරිහෙමින් පැවතුණි.